# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 8 දරන
# නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 අප්‍රේල් මස 27 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 අප්‍රේල් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.50 ශ.　　　　තැපැල් ගාස්තුව : රු. 1.55 ශ.

# 1994 අංක 8 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 අප්‍රේල් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 40/92.

## 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1994 අංක 8 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— **1989 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**" නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.**

2. (1) මේ පනතේ කාර්යය සඳහා—

(අ) (මෙහි මින් මතු " අධ්‍යක්ෂ ජනරාල්වරයා " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද) මේ පනතේ පරිපාලනය භාරව සිටිය යුතු වූ ද නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු ;

(ආ) නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයන්, නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්, නිෂ්පාදන බදු සහකාර අධ්‍යක්ෂවරයන් යම් සංඛ්‍යාවක් සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් ; සහ

(ඇ) ඉහත සඳහන් නිලධරයන්ට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි පරිපාලන, ගිණුම්, කාර්මික, නීති හා ලිපිකරු නිලධරයන් යම් සංඛ්‍යාවක් සහ වෙනත් කාර්ය මණ්ඩලය

නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයා, නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ නිෂ්පාදන බදු සහකාර අධ්‍යක්ෂවරයකු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මේ පනතින් හෝ එය යටතේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිරිනමා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ල නැතහොත් ඒවායින් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය හැකි ය.

(3) පටහැනිව ප්‍රකාශිත විධිවිධාන ඇත් නම් මිස, නිෂ්පාදන බදු සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නිලයක් දරන සෑම නිෂ්පාදන බදු නිලධරයකු

2—ධ 029527—5,955 (93/11)

විසින් ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මේ පනතේ 5අ, 8අ, 10, 12, 13, 14, 16, 18 සහ 27 වන වගන්තිවල සඳහන් යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් හැර, මේ පනතින් හෝ එය යටතේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිරිනමා හෝ නියම කර හෝ වෙන් කර දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ල ම නැතහොත් ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"නිල රහස්‍යභාවය.

2අ. (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා හැර, මේ පනත යටතේ පත් කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැනගැනීමට ලැබෙන කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහායවීම කළ යුතු ය. තවද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට, ඔහුගේ බලයලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර වෙනත් යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් දැන්විය නොයුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති යම් වාර්තා කිසිවක් ලබාගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ පත් කරනු ලැබූ සෑම තැනැත්තකු විසින්, මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට නියමිත ආකෘතියෙහි රහස්‍යභාවය පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර එවැනි දිවුරුමක් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට නියමිත ආකෘතියෙහි දී ඊට අත්සන් කළ හැකි ය.

(3) මේ පනත යටතේ පත් කරනු ලැබූ කිසිම තැනැත්තකුට මේ පනතෙහි හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, යම් වාර වාර්තාවක්, ලේඛනයක් හෝ දැන්වීමක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ

මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරවු කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක්, මේ පනත යටතේ හෝ එකී වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය වන්නේ නම් එම තැනැත්තා විසින් එම කාරණය මේ පනත යටතේ පත් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තකුට දැනුම් දිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරයකින් තම සන්තකයෙහි ඇති යම් වාර වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක්, එය ඒ විස්තරවල නිවැරදි පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම කළ හැකි ය. තව ද ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇතද, ඒ පිටපත සාක්ෂියේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, එවැනි යම් වාර වාර්තාවක් හෝ ලේඛනයක් ලියා, සැදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක, එසේ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක් ඒ වාර වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය:

එසේම තවදුරටත්, එවැනි වාර වාර්තාවක හෝ ලේඛනයක හෝ මුල් පිටපත හෝ එවැනි වාර වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටක දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කුමක් සඳහන්ව ඇතද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්ය කිරීමට අවශ්‍ය විය හැකි යම් වාර්තා හෝ ලේඛන ලබා ගැනීමට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසර දිය යුතු ය. විගණකාධිපතිවරයා හෝ මේ උපවගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු (2) වන උපවගන්තියේ කාර්යය සඳහා මේ පනත යටතේ පත් කරනු ලැබූ තැනැත්තකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින්වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් මේ පනත සාධාරණීය ලෙස පරිපාලනය කිරීමට වග බලා ගැනීමෙහි ලා ඇති අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්—

(අ) ඒ ප්‍රදේශයෙහි මේ පනත යටතේ ලියා පදිංචි කර ඇති සියලු ම නිෂ්පාදකයන්ගේ හා ආනයනකරුවන්ගේ නම් සහ ලිපින ; සහ

(ආ) ඒ නිෂ්පාදකයන් හෝ ආනයනකරුවන් විසින් යම් කාලයක් තුළ නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ පිළිබඳ විස්තරයක් හා ඒ එක් එක් භාණ්ඩය සඳහා ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරන ලද තොග මිල

ඇතුළත් ලැයිස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසු යයි සලකන යම් ආකාරයකින් පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3ඇ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 3ඇ. වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

“ඇතැම් භාණ්ඩ නිෂ්පාදන බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම.

3ඇ. (1) අමාත්‍යවරයා විසින් රටේ ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගෙන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ කිසිවක් හෝ යම් පන්තියකට හෝ විස්තරයකට අයත් නිෂ්පාදන භාණ්ඩ කිසිවක් මේ පනත යටතේ ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් නිදහස් කරනු ලැබිය හැකි —

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ඒ නියමයේ දිනයෙහි සිට බලාත්මක විය යුතු ය. එවැනි සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත සභාගත කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් මාස හයක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය. තවද මාස හයක් වූ එකී කාලය ආගණනය කිරීමේ දී පාර්ලිමේන්තුව කල් තබා ඇති හෝ විසුරුවා හැර ඇති යම් කාලයක් සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය. එවැනි යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇති අවස්ථාවක, නිදහස් කරනු ලැබූ භාණ්ඩ මත ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ඒ භාණ්ඩයේ නිෂ්පාදකයා, සාදන්නා, ආනයනකරු, බඩු තොග ලැබුම්කරු විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු අතර, ඒ නිෂ්පාදන බද්ද මේ පනතේ විධිවිධාන යටතේ අයකර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක සඳහන් භාණ්ඩ කිසිවක් ඒ නියමයේ සඳහන් කොන්දේසිවලට පටහැනිව පසුව විකුණනු ලැබූ හෝ බැහැර කරනු ලැබූ විටක, ඒ භාණ්ඩ, නිෂ්පාදන බද්දට යටත් සමාන භාණ්ඩ මත මේ පනත යටතේ ගෙවිය යුතු නිෂ්පාදන බද්දට සමාන බද්දකට යටත් විය යුතු ය. තව ද ඒ භාණ්ඩවල නිෂ්පාදකයා, සාදන්නා, ආනයනකරු හෝ බඩු තොග ලැබුම්කරු විසින්, ඒ භාණ්ඩ විකිණීමට හෝ බැහැර කිරීමට පෙරාතුව, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අවසරය ලබා ගත යුතු අතර, ඒ විකිණීම හෝ බැහැර කිරීම සිදු කරන ලද අවස්ථාවේ දී ඒ භාණ්ඩ මත ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ගෙවනු ලැබිය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ආ) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ භාණ්ඩය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබීමෙන් පසුව ගබඩා කර තබනු ලැබූ රේගු ගුදමේ වෙනත්

ස්ථානයෙහි සිට එය ඉවත් කරගෙන යාමට පෙර, ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයේ ආනයන කරු විසින්, නියමිත ආකාරයට ගෙවනු ලැබිය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(2) (අ) මේ පනතේ කුමක් සඳහන්ව ඇතද (3අ, 3ආ, සහ 3ඇ වගන්තිවල අර්ථානුකූලව නිදහස් කරනු ලැබූ භාණ්ඩයක් නොවන) ශ්‍රී ලංකාවෙන් පිටත නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් ආනය නය කරන සෑම තැනැත්තකු විසින්ම, ඒ භාණ්ඩය ගබඩා කර ඇති රේගු ගුදමෙන් හෝ වෙනත් යම් ස්ථානයකින් හෝ ඉවත් කරගෙන යාමට පෙර, 3 වන වගන්තිය යටතේ තීරණය කරනු ලැබූ නිෂ්පාදන බදු අනුප්‍රමාණ මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය සම්බන්ධයෙන් නිෂ්පාදන බදු ගෙවනු ලැබිය යුතු ය.

(ආ) ආනයනය කරනු ලැබූ නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් මත එහි වටිනාකම අනුව නිෂ්පාදන බද්දක් අය කරනු ලබන අවස්ථාවක, මේ පනතේ 7 වන වගන්තියේ හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද එම භාණ්ඩයේ වටිනාකම—

(i) ඒ නිෂ්පාදන භාණ්ඩයේ මිල, රක්ෂණය හා නැව් පැටවුම් ගාස්තුවල වටිනාකමට සමාන මුදලක් ;

(ii) බැංකු හා වෙනත් අය කිරීම් පියවීම සඳහා (i) වන අනුච්ඡේදයෙහි සඳහන් මුදලින් සියයට පහකට සමාන මුදලක් ;

(iii) යම් ලිඛිත නීතියක් යටතේ ඒ භාණ්ඩය ආනයනය කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු, සෙස් බදු හා අය කිරීම් සියල්ලේ එකතුවට සමාන මුදලක්

යන මුදල්වල මුළු එකතුව ලෙස සලකනු ලැබිය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද—

(i) අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙහි නිෂ්පා දනය කරන ලද හෝ සාදන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක්, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය යවනු ලබන වරායෙහි ගොඩ බෑම සඳහා

බැඳුම්කරයක් ලියා අත්සන් කර ඇත්නම්, එම භාණ්ඩය නිෂ්පාදන බද්ද ගෙවීම සඳහා යටත් කරනු නොලැබිය යුතු ය ; තවද

(ii) අපනයනකරුවන් විසින් අපනයනය කිරීම සඳහා භාණ්ඩ සෑදීමෙහි ලා අමු ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක්, ඒ සාදන ලද භාණ්ඩ සාදන ලද්දේ අපනයනය කිරීම සඳහා බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුව හොත්, එම භාණ්ඩය, නිෂ්පාදන බද්ද ගෙවීම සඳහා යටත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් නොවන, නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සාම්පල, ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියවිලි ඉල්ලා සිටීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇති බලය.

7අ. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ නිෂ්පාදන බදු සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන යම් නිෂ්පාදන බදු නිලධරයකු විසින්—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ එකී නිෂ්පාදන බදු නිලධරයාගේ හෝ මතය අනුව 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීමට යටත් තැනැත්තකු වන යම් තැනැත්තකු වෙත ඒ වගන්තිය යටතේ ලියාපදිංචි වන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි අතර, 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති තැනැත්තකු විසින් ඉදිරිපත් කළ යුතු යයි නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් වාර වාර්තා ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක වටිනාකම නිසැකව දැන ගැනීමේ හෝ මේ පනත යටතේ නිෂ්පාදන බද්ද අයකර ගැනීමට අදාළ යම් කාරණයක් සත්‍යාශනය කිරීමේ කාර්යය සඳහා ලියවිල්ලකින් වූ නියමයක් මගින්, දීමට හෝ ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුගේ බලයේ ඇති, නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයකට අදාළව ඒ නියමයෙහි සඳහන් යම් ස්ථානයක දී හා යම් කාලයක් ඇතුළත තොරතුරු සපයන ලෙස හෝ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් නැතහොත් නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක සාම්පල පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස ද, එවැනි යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීමට හා එයින් පිටපත් හෝ උධෘත ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඒ නිෂ්පාදන බදු නිලධරයාට ඉඩ දෙන ලෙස ද ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය;

(ඇ) නිෂ්පාදන බද්ද අයකරගනු ලැබිය හැකි තැනැත්තකු විසින් ගෙවිය යුතු නිෂ්පාදන බද්ද සම්බන්ධයෙන් ඔහුගෙන් කරුණු විමසීමේ කාර්යය සඳහා, දැන්වීමෙහි සඳහන් යම් ස්ථානයක දී, යම් දිනයක දී හා යම් වේලාවක දී තමා විසින්ම හෝ බලය දෙන ලද නියෝජිතයකු මගින් හෝ පෙනී සිටින ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද නියමයකට අනුව ක්‍රියාකිරීමෙහි ලා පරීක්ෂා කිරීම සඳහා, ඉදිරිපත් කර ඇති යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් මේ පනතේ කාර්යය සඳහා රඳවා තබා ගැනීම අවශ්‍ය වන තාක් දුරට, නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් හෝ නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිෂ්පාදන බදු සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන නිෂ්පාදන බදු නිලධරයකු විසින් හෝ තම භාරයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "එක් අවුරුද්දක කාලසීමාවක්" යන වචන වෙනුවට "අවුරුදු පහක කාලසීමාවක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියෙහි ඇති අතුරු වගන්තියේ සඳහන් "අවුරුදු පහක", යන වචන වෙනුවට "අවුරුදු දහයක" යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා අමතන ලිඛිත පෙත්සමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ අභියාචනය යට පදනම් වූ හේතු එහි නියත වශයෙන් දැක්විය යුතු ය.

(3) අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් තීරණයකට විරුද්ධව ද, ඒ තීරණය අදාළ වන කාලසීමාව සම්බන්ධයෙන් 14 වන වගන්තිය යටතේ වාර්තාවක් නොමැතිව කර ඇති අවස්ථාවක දී, අභියාචන පෙත්සම් යථා පරිදි සාදන ලද වාර්තාවක් ද සමග යවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් (1), (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ අභියාචනය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (3), (4), (5) හා (6) වන උපවගන්ති පිළිවෙලින් එහි (5), (6), (7) සහ (8) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන් ;

(3) ඒ වගන්තියේ නැවත අංක යොදන ලද (6) වන උපවගන්තියෙහි "කරනු ලැබිය හැකිය" යන වචන වෙනුවට "කරනු ලැබිය හැකි අතර, අභියාචනය පිළිබඳ ස්වකීය තීරණය අභියාචක වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (8) වන උපවගන්තියෙහි "31 ඈ වගන්තියේ (3), (4) සහ (5) වන උපවගන්තිවල" යන වචන හා ඉලක්කම් වෙනුවට "31 ඈ වගන්තියේ (6) වන සහ (9) වන උපවගන්තිවල" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 10අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" දැන්වීම භාරදීම.

10අ. (1) මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයකු, නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ නිෂ්පාදන බදු සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන යම් නිෂ්පාදන බදු නිලධරයකු විසින් දෙනු ලබන සෑම දැන්වීමක ම හෝ නිවේදනයක ම, අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයාගේ හෝ නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හෝ නිෂ්පාදන බදු නිලධරයාගේ හෝ නම සඳහන් විය යුතු අතර, ඒ දැන්වීමෙහි හෝ නිවේදනයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයාගේ, නිෂ්පාදන බදු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හෝ නිෂ්පාදන බදු නිලධරයාගේ නම් යථා පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර ඇත්නම් ඒ දැන්වීම හෝ නිවේදනය වලංගු විය යුතු ය.

(2) මේ පනත යටතේ දෙන ලද සෑම දැන්වීමක් ම හෝ නිවේදනයක් ම යම් තැනැත්තකු වෙත පෞද්ගලිකව හෝ ඔහුගේ අවසන් වරට දැන සිටි ස්ථානයට හෝ දැන්වීමට අදාළ කාලය තුළ දී ඔහු සිටින හෝ සිටි ස්ථානයට ගෙන ගොස් භාරදීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් භාර දෙනු ලැබිය හැකි ය.

(3) තැපෑලෙන් යවන ලද සෑම දැන්වීමක් ම, එය සාමාන්‍ය තැපෑලෙන් යැවීමෙන් ලැබිය හැකි දින යට පසුව එළඹෙන දිනයෙහි භාර දී ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(4) තැපෑලෙන් යවන ලද බව ඔප්පු කිරීමේ දී දැන්වීම ඇතුළත් ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

(5) මේ පනතේ කාර්ය සඳහා දෙන ලද හෝ නිකුත් කරන ලද යම් දැන්වීමක හෝ නිවේදනයක මුද්‍රණය කර ඇති හෝ අත්සන් කර ඇති නාම හොත් යම් සහතිකයක අත්සන් කර ඇති එය දීමට හෝ නිකුත් කිරීමට බලය දෙනු ලැබූ නිලධරයාගේ නාමය යයි කියනු ලබන සෑම නාමයක් ම අධිකරණීමය වශයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට අනුකූලව දෙන ලදැයි හෝ නිකුත් කරන ලදැයි කියනු ලබන කිසිම දැන්වීමක්, නිවේදනයක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ විධිවිධානවලට, අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැළපේ නම් සහ ඒ දැන්වීම,

නිවේදනය, සහතිකය හෝ ලේඛනය අදාළ වන්නා වූ හෝ ඒ දැන්වීම, නිවේදනය, සහතිකය හෝ ලේඛනය මගින් බලපෑමක් ඇති වී තිබෙන්නා වූ හෝ තැනැත්තා පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව එහි නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර, එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 11අ සහ 11ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ සහ 11ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

" නිෂ්පාදන බද්ද, පැහැර හරින්නාගේ වත්කම් කෙරෙහි වැය බරක් විය යුතු බව.

11අ. ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බදු කිසිවක් ගෙවීම පැහැර හරින්නාගේ සියලු වත්කම් කෙරෙහි වැය බරක් විය යුතු ය :

එසේ වුව ද—

(i) ඒ වත්කම්, 11ආ වගන්තිය යටතේ තහනම ට ගැනීමට පෙරාතුව වටිනාකම සඳහා නිර්ව්‍යාජ ගැනුම්කරුවකු වෙත පැහැර හරින්නා විසින් විකුණා ඇති යම් වත්කම් කෙරෙහි ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතු ය ; නැතහොත් බලනොපෑ යුතු ය :

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන විට වටිනාකම සඳහා නිර්ව්‍යාජ ලෙස ඇති කරන ලද හා 11ආ වගන්තිය යටතේ ඒ දේපළ තහනමට ගැනීමේ දිනයට පෙරාතුව ලියාපදිංචි කරනු ලැබූ යම් බද්දක් හෝ බැඳීමක් අභිබවා වැයබරට ප්‍රමුඛත්වය නොලැබිය යුතු ය ;

(iii) චංචල දේපළ සම්බන්ධයෙන් වන විට, පැහැර හැරීමේ දිනයට පෙරාතුව වටිනාකම සඳහා නිර්ව්‍යාජ ලෙස ඇති කරන ලද යම් සාප අයිතියකට හෝ බැඳීමක් අභිබවා ඒ වැයබරට ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

තහනමට ගැනීමෙන් හා විකිණීමෙන් නිෂ්පාදන බද්ද අයකර ගැනීම.

11ආ. (1) මේ පනතේ කාර්ය සඳහා බදු එකතු කරන්නන් ලෙස තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) යම් නිෂ්පාදන බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ නිෂ්පාදන බද්ද පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම, ඇතුළත් සහතිකයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරයකු හෝ බදු එකතු කරන්නකු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, සහතිකයේ නම් කර ඇති පැහැර හරින්නාගේ චංචල දේපළ තහනමට ගෙන විකිණීමෙන් ඒ තැනැත්තාගෙන් නිෂ්පාදන බද්ද අයකර ගැනීමට කටයුතු සලස්වන ලෙස, සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට මෙයින් බලය පවරා නියම කරනු ලැබේ.

(ආ) එකී තහනමට ගැනීම, වඩාත් යෝග්‍ය යයි එකී නිලධරයා සලකන යම් ආකාරයකින් සිදු කළ යුතු අතර, එසේ තහනමට ගන්නා ලද යම් දේපළක්, පැහැර හරින්නාගේ වියදමින් හා අය කිරීම මත දින පහක් තබා ගනු ලැබිය යුතු ය. පැහැර හරින්නා විසින් වියදම් හා අයකිරීම් සමග ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බද්ද එකී දින පහ ඇතුළත ගෙවනු නොලැබුවහොත්, ප්‍රාදේශීය ලේකම්වරයා හෝ බදු එකතු කරන්නා විසින් එම දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(ඇ) විකිණීමෙන් ලැබෙන මුදල—

(i) පළමුව, දේපළ තහනමට ගැනීමේ, තබා ගැනීමේ හා විකිණීමේ වියදම් හා අයකිරීම් පියවීම සඳහා ; සහ

(ii) දෙවනුව, ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බද්ද ගෙවීම සඳහා

යොදා ගනු ලැබිය යුතු අතර, යම් ඉතිරි මුදලක් වේ නම් ඒ මුදල තහනමට ගනු ලැබූ දේපළේ අයිතිකරු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් නිෂ්පාදන බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක සහ (2) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් එය අයකර ගැනීම ප්‍රායෝගික නොවන බව හෝ නුසුදුසු බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ නිෂ්පාදන බද්ද පිළිබඳ විස්තර සහ නිෂ්පාදන බද්ද ගෙවිය යුතු තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ඇතුළත් සහතිකයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පැහැර

හරින්නා පදිංචිව සිටින හෝ පැහැර හරින්නාට අයත් නිශ්චල හෝ චංචල දේපළ කිසිවක් පිහිටා ඇති යම් දිස්ත්‍රික්කයක් විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, අධිකරණය විසින් ඉන් අනතුරුව පැහැර හරින්නාගේ චංචල හෝ නිශ්චල දේපළ සියල්ල හෝ ඉන් කිසිවක් හෝ නිෂ්පාදන බද්ද අයකර ගැනීම සඳහා අවශ්‍ය යයි ඔහු සලකන ඒ දේපළින් යම් කොටසක් තහනමට ගෙන විකිණීම සඳහා පිස්කල්වරයාට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ ඊව් ආඥාවක් නිකුත් කරන ලෙස විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සහ 297 තෙක් වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ඔහු විසින්, ඒ පිළිබඳ නිවේදනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන කවර හෝ විටකදී, ඒ අවස්ථාවේ දී ම පෞද්ගලිකව භාරදීම මගින් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් පැහැර හරින්නා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය ; එහෙත් ඒ පැහැර හරින්නා විසින් ඒ නිවේදනය නොලැබීමේ හේතුවෙන් මේ පනත යටතේ වූ කටයුතු අවලංගු නොවිය යුතු ය. ".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි " සියයට දෙකකට " යන වචන වෙනුවට " සියයට තුනකට " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ අතුරු වගන්තියෙහි " ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බදු මුදලින් සියයට පනහක් " යන වචන වෙනුවට " ගෙවීම පැහැර හැර ඇති මුදල් " යන වචන ආදේශ කිරීමෙන්.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි " අදාළ දිනයේ සිට " යන වචන වෙනුවට " ගෙවීම සිදු කළ දිනයේ සිට " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.**

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (i) වන අනුඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ii) සහ (iii) වන අනුඡේද ඒ උප වගන්තියේ (i) සහ (ii) වන අනුඡේද ලෙස නැවත අංක යෙදීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියෙහි "1979 අංක 15" යන වචනය හා ඉලක්කම් වෙනුවට "1979 අංක 15" යන වචනය හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(7) (අ) 2අ(2) වන වගන්තිය යටතේ රහසගතභාව පිළිබඳ දිවුරුමක් කිරීමට නියම කර ඇති තැනැත්තකුව ඒ දිවුරුම නොකර මේ පනත යටතේ ක්‍රියා කරන ; හෝ

(ආ) 2අ(1) වන වගන්තිය හෝ 2අ(2) වන වගන්තිය යටතේ කරන ලද දිවුරුමක් හෝ කඩ කරමින් ක්‍රියා කරන ;

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(8) 3ඇ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක සඳහන් යම් භාණ්ඩයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමතය නොමැතිව හෝ ඒ නියමයෙහි සඳහන් යම් කොන්දේසියක් කඩ කරමින් හෝ විකුණන හෝ බැහැර කරන ඒ භාණ්ඩය සාදන්නා, නිෂ්පාදකයා, ආනයනයකරු හෝ බඩු තොග ලැබුම්කරු වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(9) 7අ වගන්තිය යටතේ වූ දැන්වීමක හෝ නියමයක නියමයක් අනුව ක්‍රියා කිරීම ඕනෑකමින්ම පැහැර හරින, ඒ දැන්වීම හෝ නියමය භාර දෙනු ලැබ ඇති තැනැත්තකු වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "නියෝජිතයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"බලය දෙන ලද තැනැත්තා" යන්නෙන්, මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සාදන්නකු, නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට ලිය විල්ලකින් බලය දෙන ලද යම් පුද්ගලයකු අදහස් වේ ;

"නිෂ්පාදන බද්ද" යන්නෙන් මේ පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සාදන්නකු නිෂ්පාදනය කරන්නකු, හෝ ආනයනකරුවකු විසින් ගෙවිය යුතු යම් මුදලක් අදහස් වන අතර, 12අ වගන්තිය යටතේ ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් එවැනි යම් බද්දකට එකතු කරන ලද මුදලක් ද එයට ඇතුළත් වේ ;

(2) "සාදන්නකු හෝ නිෂ්පාදකයකු" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"සාදන්නකු හෝ නිෂ්පාදකයකු" යන්නෙන්—

(අ) යම් භාණ්ඩයක් සාදන ;

(ආ) විකිණීම සඳහා යම් භාණ්ඩයක් සකසා ගන්නා ;

(ඇ) බිබූ පිරි සැකසුම් කරන හෝ එකලස් කරන යම් තැනැත්තකු අදහස් වේ.

(3) "කාර්තුව" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"ආපසු ගෙවීම්" යන්නට ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත වූ නිෂ්පාදන බද්දේ ප්‍රතිදානයක් ද ඇතුළත් වේ.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. විදේශීය රු. 1.160 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.